# ඉවසීම



මෙම කොටසේ එන ක්‍රියාකාරකම් සියලුදෙනා සමඟ ඉවසීමෙන් කටයුතු කිරීමට සහ ඔවුන්ට එකලෙස පිළිගැනීම ලබා දීමටසහභාගීවන්නන්ට සහාය වේ.සහභාගීවන්නන් විසින් ඔවුන්ගේ ආකල්ප, චින්තන විලාසයන් සහ චර්යාවන් අභියෝගයට ලක්කොට වෙනස්කම්, අගතීන්ගෙන් හා සම්ප්‍රධායන් ඉක්මවා බැලීමට ඉගෙනගනු ඇත.එය සහවේදනය පිළිබඳ ඔවුන් තුළ ඇති හැකියාව වර්ධනය කරන අතර,ඒ තුළින් විවිධත්වය සහ එහි සමෘද්ධිමත් භාවය අගය කිරීමට පුරුදු වනු ඇත.

## පොදු ගුණාංග

- ඉවසීම යනු සාමය ඇති කරන ගුණාංගයකි.
- සාමය යනු ළඟා කරගතයුතු අරමුණකි, ඉවසීම යනු ඒ සඳහා ක්‍රමවේදයයි.
- නොඉවසිලිමත්කම හටගන්නේ බිය හා නොදැනුවත්කම තුළිනි.
- ඉවසිලිවන්තයෙකුවීමට නම් අනෙකුත් පුද්ගලයින් අවබෝධකර ගැනීම හා ඔවුනට ගරු කිරීම අවශ්‍ය වේ.අපේ පවුල, මිතුරන් සහ ප්‍රජාව සමඟ සමඟියෙන් සිටීමට නම් අපේ වෙනස්කම් වටහාගැනීමට සහ ඒ තුළින් ඉගෙන ගැනීමට අපි ඉවසිලිමත් විය යුතුය.

## 5.1 ක්‍රියාකාරකම

සාකච්ඡා හරහා අවබෝධය හා ඉවසීම පිළිබඳ සංකල්ප ගවේෂණයකරන්න. විමසන්න:

- ඉවසීම යන්නේ කුමක් අදහස් වේද? යන්න විමසන්න.

පුවරුව මත සහභාගීවන්නන්ගෙන් ලබාගත් ප්‍රධාන වචන හෝ කරුණු ලැයිස්තුගත කරන්න. ඉවසීම පිළිබඳ සහභාගීවන්නන්ගේ අදහස්වලට සවන් දීමෙන්පසු ඉවසීම යනු :

“අදහස්, භාවිතයන්, ආගම, ජාතිය, පුරවැසිභාවය හෝ ඒ හා සමාන දේවල් වලින් තමන්ට වඩා වෙනස් අය කෙරෙහි දක්වන සාධාරණ සහ අපක්ෂපාතී ආකල්ප බව පවසන්න. ” (මූලාශ්‍රය : http://www.dictionary.com)

ශබ්ද කෝෂය එය අර්ථ දක්වා ඇති ආකාරය සහසහභාගීවන්නන් එය අර්ථ දැක්වූ ආකාරය හා සසඳන්න. සහභාගීවන්නන්ගේ අර්ථකථනයට යම් කිසිවක් එකතු කළයුතුදැයි පරීක්ෂා කර බලන්න.කණ්ඩායම යම් අර්ථකථනයකට එකඟ කරවාගෙන එය බිත්තියේ ඇලවිය හැකිවන පරිදි පෝස්ටරයක ලියන්න.

කණ්ඩායම සමඟ පහත කරුණු සාකච්ඡා කරන්න.

- ඉවසීම සාමය සඳහා අවශ්‍ය අංගයක් බව පැවසේ.
- සාමය හා ඉවසීම අතර පවත්නා සම්බන්ධය කුමක්ද?
- ගැටුම හා නොඉවසීම අතර සම්බන්ධතාවයක් ඇති බව පෙන්වන අවස්ථා පිළිබඳ උදාහරණ ඔබට සිහිකළ හැකිද?

දැන් ගැටුම් පිළිබඳ ලබාදුන් උදාහරණ මත පදනම්ව, ගැටුම ආරම්භවීමට බලපෑ සාධක කවරේද?යන්න සහභාගීවන්නන් සමඟ සාකච්ඡා කරන්න. ඉන්පසු ද්‍රව්‍යාත්මක වශයෙන් මෙන්ම පුද්ගලයින් මත ගැටුම් විසින් ඇති කරවනප්‍රතිවිපාක කවරාකාර ද යන්න විමසන්න.

## 5.2 ක්‍රියාකාරකම - වෙනත් පුද්ගලයෙකුගේ තත්ත්වය තමාට ආදේශ කර ගැනීම

වෙනත් පුද්ගලයෙකුගේ තත්ත්වයට පත්වීම කෙබඳු වන්නේද යන්න සොයා බැලීම සඳහා සහභාගීවන්නන් යුගල වශයෙන් එක්ව නිහඬ අභ්‍යාසයක් කරන්නට යන බව කණ්ඩායමට පවසන්න.ඔවුන් සාමාන්‍යයෙන් එතරම් ඇසුරු නොකරන අයෙකු තමන්ගේ සහකරු හෝ සහකාරිය ලෙස තෝරාගන්නා ලෙස ඔවුනට පවසන්න.යුගලයේ එක් පුද්ගලයෙකු විනාඩි 5ක් පමණ නිහඬව ඇවිද යන අතර,ඔහු ඇවිදින ආකාරය, ඔහු තම පා චලනය කරන ආකාරය, ඔහුගේ පියවරයන්හි විශාලත්වය සහ ඔහු තම පා බිම තබන ආකාරය ඇතුළු ඔහු විසින් කරන්නා වූ සියලු දේ ඔහු අනුව යමින් ඔහුගේ සහායකයා අනුකරණය කළයුතු බව ඔවුනට පවසන්න.තමන්ගේ සගයා ගමන් කරන විට ඔහුගේ බාහු හා අත් සොලවන ආකාරය අනුකරණය කළ යුතු අතර, ඔහු කුමක් දෙස බලන්නේද යන්න හා ඔහු කුමකට ඇහුම්කන් දෙන්නේ ද යන්න පිළිබඳවද සැළකිලිමත් විය යුතුය.විනාඩි 5 කට පසු එකිනෙකා තම භූමිකා දෙක මාරු කරගත යුතුය.

නැවත ප්‍රධාන කණ්ඩායමට ගිය පසු එම ක්‍රියාකාරකමේ දී සහභාගී වන්නන් විසින් සොයාගත් කරුණු පිළිබඳව පහසුකම් සපයන්නා විසින් සාකච්ඡාවක් ගොඩනගා ගතයුතුය.

"Walk a mile in my shoes" is good advice. People will learn to respect others and have tolerance for others if they are used to imagining themselves in another's place.

ඉවසීම පිළිබඳ ඉහත සඳහන් අර්ථකථනය සිහිතබා ගන්න. ඉවසීම යනුවෙන් අදහස් කරන්නේ ඔබ,ඔබට වඩා වෙනස් වූ පුද්ගලයින්ගේ චර්යාවන්ටහුරුවිය යුතු බව නොවේ. අනෙකාගේ තත්ත්වය තමාට ආරෝපණය කර ගැනීම හෙවත් අනෙකාගේ සපත්තුව පැළඳීම වූ කලී වෙනත් අයෙකුගේ විවිධත්වයන් පිළිබඳව අවබෝධය ප්‍රගුණ කර ගනිමින් ඒ කෙරෙහි සාධාරණ ආකල්පයක් ඇති කර ගැනීමේ ක්‍රමයකි.

## 5.3 ක්‍රියාකාරකම - වෙනස්කොට සැලකීම

වෙනස්කොට සැලකීම පිළිබඳව යම් අවබෝධයක් ලබා ගැනීම සහභාගීවන්නන්ට මෙම ක්‍රියාකාරකම තුළින් මඟ පෙන්වනු ලැබේ. විමසන්න:

- අප විසින් මිනිසුන් කාණ්ඩගත කරන හෝ වෙන් කරනු ලබන අනෙකුත් ක්‍රම මොනවාද? යන්න විමසන්න.

ඔවුන්ගේ සියලු ප්‍රතිචාරයන්ට ඇහුම්කන්දී ඒවා පුවරුව මත ලියන්න. ජාතිය, සමේ වර්ණය, සංස්කෘතිය, ආගම හෝ මුදල්, අලංකාරය, බුද්ධිය යන කරුණු ඔවුන් විසින් සඳහන් කර නොමැති නම්, ඔබ විසින් එම කරුණු එක් කිරීමට සමත්විය යුතුය.

-  හුදෙක් මිනිසුන් දෙස බැලීමෙන් පමණක් අපට ඔවුන් කවරාකාරදැයි යන්න ප්‍රකාශ කළ හැකිද? යන්න සහභාගීවන්නන්ගෙන් විමසන්න.

 ඔවුන්ගේ ප්‍රතිචාර සාරාංශගත කරන්න.

ඉන්පසු:

- ජනවාර්ගික හා ආගමික වශයෙන් වෙන්කොට සැලකීම යන්නෙන් අදහස්කරන්නේ කුමක්ද යන්න කිසිවෙකුට හෝ පැහැදිලි කළහැකිද? යන්න විමසන්න.

ඔවුන්ගේ ප්‍රතිචාර වලට ඇහුම්කන් දීමෙන් පසු,කණ්ඩායමක් හෝ පුද්ගලයකු අදහන හෝ නොඅදහන දෙය හේතුකොට ගෙන,ඔවුන් වෙනස්කොට සැලකීම සහ ඇගයීම හෝ ඔවුන්ට නින්දා සහගත ලෙස සැලකීම ආගමික වශයෙන් වෙනස්කොට සැලකීම යනුවෙන් හඳුන්වන බව පවසන්න.

.මෙය සිදුවන්නේ විවිධ ආගම් අදහන්නන්ට අසමාන ලෙස සළකනු ලබනවිටදීය.වාර්ගික වෙනස් කොට සැලකීම යනු පුද්ගලයෙකුට හෝ කණ්ඩායමකට ඔවුන්ගේ ජාතිය ජනවර්ග හෝ සංස්කෘතිය මත පදනම්ව වෙනස් ලෙස හෝ අනර්ථකාරී ලෙස සලකනු ලැබීමයි.

විමසන්න:

- තමා වෙනස් කොට සැලකීමකට ලක්වූ අවස්ථාවක් පිළිබඳ අත්දැකීම්අන් අය හා බෙදා ගැනීමට කවරකු හෝ කැමතිද යන්න සහභාගීවන්නන්ගෙන් අසන්න.
- ඔවුන් මෙම විෂම සැලකීමට ප්‍රතිචාර දැක්වූයේ කෙසේද?
- ඍණාත්මක වචනවලින් ප්‍රතිචාර දැක්වීමේ ප්‍රතිවිපාක කවරේද?
- සාමකාමී තත්ත්වයක් පවත්වාගෙන යාමට ඔබට ප්‍රතිචාර දැක්විය හැකි අනෙකුත් ක්‍රම මොනවාද? යන කරුණු සහභාගීවන්නන්ගෙන් විමසන්න.

ඔබ අගෞරවයට ප්‍රතිචාර දැක්වීම නම් වූ ක්‍රියාකාරකම අවසන් කළපසු(3.4 ක්‍රියාකාරකම) වෙනස්කොට සැලකීම පිළිබඳ උදාහරණවලට ප්‍රතිචාර පිළියෙළ කරන ලෙස ඔවුන්ගෙන් ඉල්ලාසිටින්න.සහභාගිවන්නන්ට දෙදෙනා බැගින් එක්ව ක්‍රියාකාරකම සිදුකළ හැක.එහිදී එක් පුද්ගලයකු විසින් යම් විෂම සැලකීමක් පිළිබඳ උදාහරණයක් ප්‍රකාශ කරන අතර, අනෙක් පුද්ගලයා කළහකාරීබවකින් තොරව එයට ප්‍රතිචාර දක්වයි.

"It is important to hear personal stories about experiences of intolerance because this will help participants understand diversity, as well as the real effects of intolerant behavior. People might feel angry when telling their stories but through active listening the facilitator can assist the speaker to express the core emotions beneath the anger, such as fear, sadness and shame. Being given the opportunity to express these feelings helps the person move on from their anger and begin feeling better. It is really important that the facilitator and all the participants practice compassionate listening when these stories are being told. If participants are speaking while the story is being shared you can gently interrupt the speaker and say 'It makes it hard for me to hear when people are talking among themselves and I really want to hear this story'. Remember you are a role model for values-based behavior so it makes no sense to yell angrily, it is more effective to explain to the people disturbing the group the consequences of their behavior.

## 5.4 ක්‍රියාකාරකම - ඉවසිලිවන්ත ලෝකයක් පරිකල්පනය කිරීම

සහභාගීවන්නන්ට ඔවුන් විසින්ම දෘෂ්‍යකරණ අභ්‍යාසයක් සිදුකිරීමට යන බව පවසන්න.මේ සඳහා ඔවුන් නිහඬව පහසු ස්ථානයක හිඳගෙන සිටිමින් පහසුකම් සපයන්නාට ඇහුම්කන් දීම සිදුකළ යුතුය. සහභාගීවන්නන්ට තම ඇස් වසා ගන්නා ලෙස උපදෙස් දෙන්න.පහත සඳහන් එක් එක් කරුණු ප්‍රකාශ කරන්න.එක් කරුණක් කියවීමෙන් පසු අනෙක් කරුණ පැවසීමටමද විරාමයක් ගන්න.

- ඔබට සැබෑ ලෙසම සතුට දැනුන, ඔබගේ පවුලේ, මිතුරන්ගේ හා අසල්වාසීන්ගේ ආදරය දැනුණ අවස්ථාවක් සිතා ගන්න.
- සියලුදෙනාට නිරතුරුවම එසේ දැනෙන්නේ නම් ලෝකය කවරාකාර විය හැකිදැයි සිතා ගන්න.
- සෑමකල්හිම සියලු දෙනාම එකිනෙකා කෙරෙහි ඉවසීම ප්‍රකට කරන්නේ නම් ශ්‍රී ලංකාව කවරාකාරයේ රටක්විය හැකිදැයි සිතා ගන්න.

දැන් ප්‍රධාන කණ්ඩායම තුන්දෙනා බැගින් හෝ හතරදෙනා බැගින් කණ්ඩායම්වලට බෙදන්න.සෑම කණ්ඩායමකටම කඩදාසි කැබැල්ල ලබා දෙන්න (විශාල කැබැල්ලක් නම් වඩාත් යහපත්ය)සෑමවිටකම සියලුදෙනාම එකිනෙකා කෙරෙහි ඉවසීම ප්‍රකට කරන්නේ නම්,තමාගේ ප්‍රජාව හෝ ශ්‍රී ලංකාව දිස්වනු ඇති ආකාරය සිතුවමට නගන ලෙස ඒ ඒ කණ්ඩායම්වලට උපදෙස් දෙන්න.

එය අවසන් වූ පසු සෑම කණ්ඩායමකටම,ප්‍රධානකණ්ඩායම වෙත තමන් නිර්මාණ ඉදිරිපත් කොට එය විස්තර කරන ලෙසට ආරාධනා කරන්න.

## 5.5 ක්‍රියාකාරකම- වෙනත් විශ්වාසයන් කථා කිරීම හා ඔවුන්ට ඇහුම්කන් දීම

සහභාගීවන්නන් සමඟ සංවාදයක් පැවැත්වීම සඳහා විවිධ විශ්වාසයන්ගෙන් යුත් පුද්ගලයින්ටආරාධනා කරන්න. තමාගේ පුද්ගලික අතීත අත්දැකීමක් හෝ තමන්ගේ විශ්වාසයන් ප්‍රධාන අංග පිළිබඳ කණ්ඩායම සමඟ බෙදාහදා ගන්නා ලෙස අමුත්තාගෙන් ඉල්ලා සිටින්න. ආරාධිතයා/ ආරාධිතයන් පිළිබඳව සහභාගීවන්නන්ට කල්තියා දැනුම් දී ආරාධිතයාගෙන් ඇසිය හැකි ප්‍රශ්න පිළිබඳ සහභාගීවන්නන් පිළිබඳ සහභාගීවන්නන් කල් ඇතිව සූදානම් කරන්න.මීට අමතරව,වෙනත් සංස්කෘතීන්ට හෝ ජන වර්ගයන්ට අයත් පුද්ගලයින්ටපැමිණ තම කණ්ඩායම සමග සාකච්ඡා කරන ලෙස ඔබට ආරාධනා කළහැක. සහභාගීවන්නන්ට නිදහස්ව ප්‍රශ්න ඇසීමට ප්‍රමාණවත් කාලයක් ලබා දිය යුතු අතර,අවශ්‍යවන්නේ නම් කාරුණික බව සහ සක්‍රීය සවන් දීම පිළිබඳ උගත් කරුණු නැවත ඔවුන් වෙත සිහිපත් කරන්න.එකී ආරාධිතයා පැමිණ ගිය පසු එම සාකච්ඡාවෙන් උගත්තේ කුමක් ද යන්න සහභාගීවන්නන්ගෙන් විමසන්න.

ප්‍රායෝගිකව කළ හැකි උචිත වේ නම්,ඔබට වෙනත් ආගමකට අයත් පූජනීය ස්ථානයක් දැක බලා ගැනීම සඳහ චාරිකාවක් සූදානම් කළ හැක.ඔබගේ කණ්ඩායම හා එකී සිද්ධස්ථානයේ ආගමික අනුගාමිකයන්අතර සාකච්ඡාවකට පහසුකම් සැලසීමට මෙහිදී ඔබටහැක.

## 5.6 ක්‍රියාකාරකම - ඉවසීමේ අවස්ථා පිළිබඳ කාර්ඩ්පත්

සහභාගීවන්නන් කුඩා කණ්ඩායම්වලට බෙදා ඔවුන් යම් භූමිකා රංගනයක් සිදුකිරීමට යන බවපවසන්න. ලබා දී ඇති අවස්ථා කාඩ්පත් හෝ ඔබ විසින්ම නිර්මාණය කරන ලද කාඩ්පත් මෙහිදී භාවිත කරන්න.සෑම කණ්ඩායමකින්ම එක් අයෙක් පැමිණ අහඹු ලෙස කාඩ්පත්රැගෙන, නැවත තමකණ්ඩායම වෙත යන ලෙස ඉල්ලා සිටින්න.කණ්ඩායම විසින් කාඩ් පත්කියවා එහි සඳහන්ව ඇති අවස්ථාව, කණ්ඩායම තුළ සාකච්ඡා කොට සෑම දෙනාම එක්ව ඒ සඳහා ලබා දිය හැකි විසඳුම් කවරේද යන්න පිළිබඳ එකඟතාවයකට පැමිණෙන්න. කාල වේලාව ඇත්නම් පත්‍රයේ සඳහන් ඇති අවස්ථාව නිරූපණය කරන කෙටි භූමිකා රංගනයක් ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන්න.

ඕනෑම පරිච්ඡේදයක් සඳහා අවස්ථා කාඩ්පත් භාවිතා කළ හැක. වත්මන් ගැටලු සහ ඔබ කණ්ඩායමට අදාළ තත්ත්වයන් පාදක කරගෙන ඔබට, ඔබේම කාඩ්පත් නිර්මාණය කළ හැක.

## ඉවසීමේ අවස්ථා පිළිබඳ කාර්ඩ්පත්

භූමිකා රංගන සඳහා පහත දැක්වෙන කාර්ඩ්පත් භාවිත කරන්න.කාර්ඩ්පත් කතුරෙන් කපා එක් කණ්ඩායමකට එක් කාර්ඩ්පත බැගින් ලබා දෙන්න.කතාන්දරයේ අවසානයක් නිර්මාණය කරගෙන ඉදිරිපත්වීමට සහභාගීවන්නන් හට ඉඩදෙන්න.චරිත නිරූපණය අවසන් වූ පසු,එක් එක් අවස්ථාවට අදාළ ඉවසීමේ කාර්යභාරය ඉවසීමේ සහ නොඉවසීමේ ප්‍රතිඵල සාකච්ඡා කරන්න.ඔබට ඔබගේම අවස්ථා කාර්ඩ්පතක් ද නිර්මාණය කළ හැක.

| | |
|---|---|
| එය සිකුරාදාවකි.සියලුම පිරිමින් සිකුරාදා යාඥාවට සහභාගීවීමට පැමිණ ඇති හෙයින් පල්ලියෙන් පිටත බොහෝ වාහන නවතා තිබුණි.විනාඩි දහයකින් යාඥාව ආරම්භ වන බැවින්,වුඩු නම් ආගමික වතාව සිදුකිරීමසඳහා පිරිමින් පෙළ ගැසී ඇත. පිටත පාරේ විශාල වාහන තදබදයක්විය. එය උණුසුම් කාලගුණයක් සහිත දිනයක් වූ අතර,රියදුරෝ තම වාහනයේ නළා හඬවමින් පසුවූහ.යාඥාව සඳහා සූදානම් වන විට,මිනිසුන් කණ්ඩායමක් කේන්තියෙන් පල්ලිය වෙතට ආහ.මන්දයත් පල්ලියෙන් පිටත නවතා ඇති වාහන බොහොමයක් නවතා ඇත්තේ ප්‍රධාන මාර්ගය ආවරණය කරමින්ය.වාහනනැවැත්වීමට ලබා දී ඇති ඉඩකඩ ප්‍රමාණවත් නොවූනිසා මිනිසුන් මෙසේ තම වාහන පාර අයිනේ නවතා ඇත.වාහන තදබදයට මූලික හේතුව වී ඇත්තේ මෙයයි.පල්ලිය වෙත ගමන් ගන්නා ලද පිරිස මේ වන විට කෑකෝ ගසමින් සිටිති. ''වුඩු"වතාව සඳහා පෝළිම් ගැසී ඇති පිරිමින් මෙයට කෙසේ ප්‍රතිචාර දක්වයිද? කුමක් සිදුවිය හැකිද? | සම්පූර්ණයෙන්ම ගමටම බලපාන පරිදි මෑතකදී ගංවතුර තත්ත්වයක් ඇතිවූ අතර, බොහෝ පුද්ගලයිනට තම නිවාස අහිමිවිය.ඒගමනවදුරටත් වාසය කිරීම සඳහා ආරක්ෂිත ස්ථානයක් නොවන බවට ප්‍රකාශ කළ රජය,පැයක පමණ කාලයකින් යා හැකි දුරක පිහිටි තවත් ගමක මෙම ගම්වාසීන්ව පදිංචි කරවන ලදී. ගංවතුරෙන් ආපදාවට පත් බොහෝ දෙනා කතෝලිකයෝ වූ අතර,වන්දනා කටයුතු සඳහා එහිකුඩා පල්ලියක් ඉදිකර ගැනීමට ඔවුන්ට අවශ්‍ය විය.ක්‍රිස්තියානි අලූත් පදිංචිකරුවන්ට අමතරව,ගමේ සිටින බොහෝ මිනිසුන් බෞද්ධයෝ වූ අතර, ඔවුහු පරම්පරා ගණනාවක් එම ගමේ ජීවත්ව ඇත.ක්‍රිස්තියානු ප්‍රජාව තම පල්ලිය ඉදිකරමින් සිටින අතරතුර ප්‍රදේශයේ ගම්වාසීන්ගෙන් සමහරුපැමිණ පල්ලිය විනාශ කිරීමට පටන් ගනිති. මින්පසු සිදුවන්නේකුමක්ද? |
| කෙසේද යන්න පිළිබඳ ඔවුන් නොඉවසිල්ලෙන් පසුවේ.බසය මාර්ග සංඥා අසල නවත්වන ලද අතර,බසයේ විවෘත ජනෙල් අතරින්,තරුණයෝ මාර්ගයේ ගමන් කරමින් සිටි මිනිසුන්ට කෑගසන්නට විය.සමහර තරුණයෝ හොඳ වචන පවසමින් කෑගැසූ අතර,ඇතැමෙකු අකාරුණිකවදනින් කෑගැසූහ.පාර අයිනේ බෞද්ධ භික්ෂුවක් සිටගෙන සිටි අතර,උන්වහන්සේ තම සම්ප්‍රදායික ඇඳුමෙන් සැරසී සිටියහ. බසයේ සිටි තරුණයෝ භික්ෂූන්වහන්සේට උසුළුවිසුළු කිරීමට පටන් ගත්හ.ඔවුන්ගෙන් අයෙකු භික්ෂූන් වහන්සේගේ චීවරයෙන් අදින්නට උත්සාහ ගත්තේය.බසයේ සිටින සමහර තරුණයෝ ප්‍රීතියෙන් කෑ ගැසූ අතර, අනෙක් තරුණයෝ තම සගයින් සිදු කරන දෙයින් අපහසුතාවයට පත්විය.ඊළඟට සිදුවන්නේ කුමක්ද? | කාර්යාලයට අලූතින් සේවිකාවක් පැමිණ ඇත.ඇය අන් සියලූදෙනාටම වඩා වෙනස් වූ සංස්කෘතියකින් පැමිණි තැනැත්තියකි.ඇයගේ දිවා ආහාරය කාර්යාලයට රැගෙන එනඅතර, ඒවා අසාමාන්‍ය බවක් පෙන්නුම් කරයි.කාර්යාලයේ අන් අය අනුභව කරන ආහාර හා සසඳන කල,ඒ තුළින් හමාඑන්නේ ඉතා වෙනස් වූ සුවඳකි. ඉන් බලවත් දුගඳක් වහනය වන බව බොහෝ දෙනාගේ අදහස වූඅතර, ඔවුහු එයඇයටපවසති.ඇයගේ ප්‍රතිචාරය කෙබඳු වියහැකිද?අනෙකුත් සේවකයන්ගෙන්ද ලැබිය හැකි ප්‍රතිචාර මොනවාද? |
| එය මුස්ලිම්වරුන්ගේ රාමසාන් උත්සව සමයයි.විදේශිකයෝ කාණ්ඩායමක් ශ්‍රී ලංකාවේ සංචාරය කරමින් සිටියහ. ඔවුන්ගේ සංචාරක බස් රථය මුස්ලිම් ජනතාව බොහොමයක් වෙසෙන ගමක නතර කරන ලදඅතර,එය රාමසාන් කාලය බැවින් ප්‍රදේශයේ බොහෝ වැසියෝ සිටියේ උපවාසයෙන්ය.විදේශිකයන්අතුරින් සමහරු අවට සිරි නැරඹීම සඳහා බසයෙන් බැස්සහ. කාලගුණය ඉතා උණුසුම්ව පැවති අතර, ඔවුන්ගෙන්සමහරු මාර්ගය දිගේ ගමන් කරමින් සිටියහ.ඔවුහු පිපාසිතවසිටි බැවින්, ඔවුන්ගේ ගමන් මලූතුළ වූ බෝතල් කළබීම වර්ග එළියට ගෙන බීමට පටන් ගත්හ. උපවාසයේ යෙදී සිටි සමහරුමෙය දකිති. ඔවුන්ගේ ප්‍රතිචාර කෙබඳු විය හැකිද?විය හැකි ද @ | |